SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## 2016 ජනවාරි විභාගය - AA3 මට්ටම

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA35)

## සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය
## (CPT)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.**

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## 2016 ජනවාරි විභාගය - AA3 මට්ටම
## (35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**(මුළු ලකුණු 20)**

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a) සීමාසහිත සුපර්ටෙක් (පෞද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් බැවින් එහි ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. එමනිසා ආදායම් බදු අරමුණු සඳහා තක්සේරු වර්ෂ 2014/2015 දී සීමාසහිත සුපර්ටෙක් (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ වාසික සමාගමකි.

(b) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන ජයසූරිය මහතා තක්සේරු වර්ෂ 2014/2015 දී පහත සඳහන් කාලසීමාවන් තුළ ශ්‍රී ලංකාවේ කායික වශයෙන් පෙනී සිට ඇත.

| ශ්‍රී ලංකාවෙන් පිටවූ දිනය | ශ්‍රී ලංකාවට පැමිණි දිනය | ශ්‍රී ලංකාවේ නොසිටි දින ගණන |
|---|---|---|
| 23.03.2014 | 08.05.2014 | 38 |
| 27.07.2014 | 16.09.2014 | 51 |
| 10.11.2014 | 07.01.2015 | 58 |
| 02.03.2015 | 28.04.2015 | 29 |
| | | **176** |

ජයසූරිය මහතා තක්සේරු වර්ෂ 2014/2015 තුළ දින 183 කට වඩා වැඩි ගණනක් ශ්‍රී ලංකාවේ කායිකව පෙනී සිට ඇති බැවින් ආදායම් බදු කාර්යය සඳහා ඔහු වාසික සේ සැලකේ.

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a) 'දරුවා' යන්නෙන් වයස අවුරුදු 18 ට අඩු දරුවකු අදහස් වන අතර යම් පුද්ගලයෙකු පුරවැසි වන රටේ නීතියට (ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නම් ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත ද වෙනත් රටක පුරවැසියෙකු නම් එම අදාළ රටේ ළමයින් හදාවඩා ගැනීමේ නීතිය ද) අනුව හදාවඩාගත් දරුවකු ද ඊට ඇතුළත් වේ. එහෙත්

- වෙනත් යම් නීතියක් යටතේ හදාවඩාගත් දරුවකු
- විවාහක දරුවකු
- අවජාත දරුවකු

ඊට ඇතුළත් නොවේ.

(b) නෙත්මිගේ දෙමාපියන් දික්කසාද වී ඇත්තේ තක්සේරු වර්ෂ 2014/2015 දී නිසා එම තක්සේරු වර්ෂයට අදාළ නෙත්මිගේ ආදායම ඇයගේ පියා වන සොයිසා මහතාගේ ආදායමට එකතු කර බද්දට යටත් කළ යුතුය. තක්සේරු වර්ෂ 2015/2016 සිට නෙත්මි ඇයගේ මව සමග ජීවත් වන නිසා ඇයගේ මව වන සොයිසා මහත්මියගේ ආදායමට එකතු කර බද්දට යටත් කළ යුතුය.

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව සේවා නියුක්තිකයෙකුට ලැබෙන 'ප්‍රසාද දීමනා' එම සේවා නියුක්තිකයාගේ සේවා නියුක්ති ආදායමේ කොටසක් සේ සලකා ආදායම් බද්දට යටත් කළ යුතුය.
නමුත් සීමාසහිත AB සමාගමේ පැරණි සේවකයෙකු වන පෙරේරා මහතාට හදවත් සැත්කමකට භාජනය වීම වෙනුවෙන් අදාළ ඇගයීමට කළ විශේෂ ගෙවීමක් වන නිසා සේවා නියුක්ති ආදායමේ කොටසක් සේ සලකා බද්දට යටත් නොකළ යුතුය. මෙහිදී අදාළ සමාගම ගෙවීම සඳහා භාවිත කළ වචනය මත පිහිටා කටයුතු නොකළ යුතුය.
ක්‍රිබ් එදිරිව ආදායම් බදු කොමසාරිස් නඩු තීන්දුව ලබාදීමේ දී මේ හා සමාන කරුණු සාකච්ඡා වී ඇති අතර එම නඩුවේ දී ගෙවීම් කරන පාර්ශ්වය භාවිත කළ වචන මත පදනම්ව තීන්දු නොගත යුතු බවත් අදාළ ගෙවීමට හේතු වූ කාරණාව කෙරෙහි අවධානය යොමු කළ යුතු බවටත් නිගමනය කරන ලදී.

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(i) කුමන හෝ භාණ්ඩයක් ආනයනය කිරීම

(ii) පනතට අනුව බැහැර කළ / ඉවත් කළ ද්‍රව්‍යයක් හැර වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම

(iii) පනතට අනුව බැහැර කළ / ඉවත් කළ සේවා ලෙස හඳුනාගත් සේවා හැර වෙනත් ඕනෑම සේවාවක් සැපයීම

(iv) නිෂ්පාදකයෙකු විසින් ම යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කර විකිණීමක් නොවන තොග හා සිල්ලර වෙළෙඳාම තොග හා සිල්ලර වෙළෙඳාමට අදාළ වන බද්දට යටත් වන පිරිවැටුම පහත ආකාර වේ.

| | |
|---|---|
| බෙදාහරින්නන්ගේ පිරිවැටුමෙන් | 25% |
| නිෂ්පාදකයන්ගේ පිරිවැටුමෙන් | 50% |

**A කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) ටම උත්තර අපේක්ෂිතය.

(මුළු ලකුණු 30)

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a) තක්සේරු වර්ෂ 2014/2015 දී **"SJ ඇසෝසියේට්ස්"**

හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය ගණනය කිරීම (රු.)

| විස්තරය | + | - |
|---|---|---|
| ගිණුම්ගත ශුද්ධ ලාභය | 8,258,300 | |
| වෘත්තීය ගාස්තු - විදේශීය මුදලින් | | 3,539,100 |
| සුදත්ට ගෙවූ වැටුප් | 600,000 | |
| (ඉතිරිය සේවක වැටුප් වන අතර ඉඩදිය හැකිය) | | |
| දුරකථන - වියදමක් ලෙස ඉඩදිය හැකිය. | | |
| ලිපිද්‍රව්‍ය - වියදමක් ලෙස ඉඩදිය හැකිය. | | |
| ක්ෂයවීම් | 36,800 | |
| ක්ෂයවීම් සඳහා දීමනා | | 60,000 |
| විදුලිය - වියදමක් ලෙස ඉඩදිය හැකිය. | | |
| පොලිය - වියදමක් ලෙස ඉඩදිය හැකිය. | | |
| ජලය - වියදමක් ලෙස ඉඩදිය හැකිය. | | |
| විදේශීය මුදල් ආදායම ඉපැයීමට දරණ ලද වියදම | 525,000 | |
| | 9,420,100 | 3,599,100 |
| | (3,599,100) | |
| **හවුල් ව්‍යාපාරයේ බද්දට යටත් බෙදිය හැකි ලාභය** | **5,821,000** | |

| හවුල් ව්‍යාපාරයෙන් ලද බද්දෙන් නිදහස් බෙදිය හැකි ලාභය | (රු.) |
|---|---|
| විදේශීය මුදලින් ලද වෘත්තීය ගාස්තු | 3,539,100 |
| අඩු කළා - | |
| විදේශීය මුදල් ආදායම ඉපැයීමට දරණ ලද වියදම් | (525,000) |
| **විදේශීය මුදලින් ලද ව්‍යාපාර ආදායම / ලාභය** | **3,014,100** |

| හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය | |
|---|---|
| ආදායම් බද්දට යටත් බෙදිය හැකි ලාභය | 5,821,000 |
| බද්දෙන් නිදහස් බෙදිය හැකි ලාභය | 3,014,100 |
| **හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි මුළු ලාභය** | **8,835,100** |

(b) **"SJ ඇසෝසියේට්ස්" හවුල් ව්‍යාපාරයේ**

**ලාභ බෙදාහැරීමේ ප්‍රකාශනය** (රු.)

| | සුදත් | ජගත් | එකතුව |
|---|---|---|---|
| වැටුප් | 600,000 | -- | 600,000 |
| ලාභ කොටස | | | |
| බද්දෙන් නිදහස් | 2,009,400 | 1,004,700 | 3,014,100 |
| බද්දට යටත් | 3,480,667 | 1,740,333 | 5,221,000 |
| **මුළු ලාභය** | **6,090,067** | **2,745,033** | **8,835,100** |

(c) **තක්සේරු වර්ෂ 2014/2015 දී "SJ ඇසෝසියේට්ස්"**

**හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු බද්ද ගණනය කිරීම** (රු.)

| | |
|---|---|
| හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය | 8,835,100 |
| අඩු කළා - බද්දෙන් නිදහස් බෙදිය හැකි ලාභය | 3,014,100 |
| ආදායම් බද්දට යටත් බෙදිය හැකි ලාභය | 5,821,000 |
| අඩු කළා - බද්දෙන් නිදහස් දීමනාව | (1,000,000) |
| ආදායම් බද්දට යටත් ලාභය | 4,821,000 |
| එකතු කළා - හවුල් ව්‍යාපාරයේ වෙනත් ආදායම් | -- |
| හවුල් ව්‍යාපාරයෙන් ලද බද්දට යටත් ලාභය / ආදායම | 4,821,000 |

හවුල් ව්‍යාපාර බද්ද = 4,821,000 x 8%

= **385,680**

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a) බද්දට යටත් සැපයූ සේවා

| | | |
|---|---|---|
| **නිමැවුම් බද්ද** | | |
| දේශීය සේවාදායකයන්ට සැපයූ සේවා මත | 4,250,000 x 11% | 467,500 |
| අනේවාසික සේවාදායකයන්ට සැපයූ සේවා මත | 6,500 x 141 x 0% | 0 |
| ඡායා පිටපත් යන්ත්‍රය විකිණීම | 166,500 x 11/111 | 16,500 |
| මුළු නිමැවුම් බද්ද | | 484,000 |
| **යෙදවුම් බද්ද** | | |
| කාර්යාල වියදම් මත | 130,000 | |
| ගමන් මිමන් සඳහා භාවිත කරන වාහනයක් අලුත්වැඩියාව මත | -- | |
| පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ හිලව් ගෙවූ යෙදවුම් බද්ද | 36,000 | |
| මුළු යෙදවුම් බද්ද | 166,000 | |
| නිමැවුම් බද්ද 100% | 484,000 | |
| ∴ ඉඩදිය හැකි යෙදවුම් බද්ද (ඉහත අගයන් දෙකෙන් අඩු අගය) | | (166,000) |
| කාර්තුව සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද | | 318,000 |
| අඩු කළා - එකතු කළ අගය මත බදු වාරික ගෙවීම් | | (120,000) |
| **කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි එකතු කළ අගය මත බද්ද** | | **198,000** |

(b) සෑම දින 15 ක් පාසා පහත පරිදි එකතු කිරීමේ අගය මත බදු ගෙවිය යුතුය.

1. පළමු දින 15 සඳහා එක් එක් මාසයේ අවසානයේ දිනට
2. එක් එක් මාසයේ ඉතිරි කාලය සඳහා ඊළඟ මාසයේ 15 වන දිනට
3. අවසන් ගැලපුමක් වෙතොත් එය අය වාර්තාව ඉදිරිපත් කිරීමත් සමග

(අප්‍රේල් 30, මැයි 15, මැයි 31, ජුනි 30, ජූලි 15)

## 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a) වලංගු අභියාචනයක තිබිය යුතු අවශ්‍යතා

(i) තක්සේරු දැන්වීමේ දින සිට දින 30 ක් ඇතුළත අභියාචනය ඉදිරිපත් කර තිබීම

(ii) එය ලිඛිතව කොමසාරිස් ජනරාල් වෙත යොමු කර තිබීම

(iii) අභියාචනයට හේතු පැහැදිලිව සඳහන් කර තිබීම

(iv) වාර්තාවක් සපයා නොමැති අවස්ථාවක කරන ලද ඇස්තමේන්තු තක්සේරුවක් වූ විටෙක අභියාචනය සමග වාර්තාව ද යොමු කිරීම

(v) වාර්තාව අනුව අදාළ බදු මුදලක් සහ දඩ මුදලක් ඇත්නම් ඒවා ගෙවා තිබීම

(b) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රමාද වූ අභියාචනයක් පිළිගනු ලැබිය හැකි අවස්ථාවන්. තක්සේරු දැන්වීම ලැබෙන අවස්ථාවේ දී,

- බදු ගෙවන්නා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විටදී
- බදු ගෙවන්නාගේ අසනීප තත්ත්වයක් මත
- වෙනත් සාධාරණ හේතූන් මත

(c) කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය ලද බව දන්වනු ලබන අතර, තක්සේරු දැන්වීම නිකුත් කළ තක්සේරුකරු හැර වෙනත් තක්සේරුකරුවකු හට තවදුර කරුණු පරීක්ෂා කිරීමට නියෝග කරනු ඇත. අවශ්‍ය ගැලපීම් කළ හැකි අතර එකඟත්වයක් ඇතොත් අභියාචනය විසඳා නිම කළ හැකිය.

aat SRI LANKA

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) ටම උත්තර අපේක්ෂිතය.

(මුළු ලකුණු 50)

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

සී/ස රජරට ඉම්පෝර්ටර්ස් (පෞද්ගලික) සමාගම

2014/2015 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම

| | | | + | - | |
|---|---|---|---|---|---|
| බදු පසු ශුද්ධ ලාභය | | | | 12,847,325 | |
| ක්ෂයවීම් | ඉඩ නොදේ | | | 294,000 | |
| ක්ෂය වෙන් කිරීම් | | | | | |
| ඉඩම | අදාළ නොවේ | | | | |
| කාර්යාල උපකරණ | 78,000 | 33 1/3 | 26,000 | | |
| ලොරි රථය | 2,500,000 | 20 | 500,000 | | |
| ගෘහභාණ්ඩ | 26,000 | 20 | 5,200 | | |
| පරිගණක උපකරණ | 280,000 | 25 | 70,000 | | |
| පරිගණක මෘදුකාංග | 65,000 | 100 | 65,000 | | 666,200 |
| පරිගණක - කල්බදු | අදාළ නොවේ | | | | |
| <u>මූල්‍ය කල්බදු වාරික - මුද්‍රණ යන්ත්‍රය</u> | | | | | |
| මුළු කල්බදු වටිනාකම | | 7600 * 24 | 182,400 | | |
| ගෙවූ වාරික | | 7600 * 9 | 68,400 | | |
| | සීමාවන් | 182,400/4 | 45,600 | | |
| | | | | | 45,600 |
| කල්බදු පොලිය | | | | 14,325 | |
| ණය පොලිය - බැංකු ගාස්තු | | | | 68,200 | |
| ලාභාංශ ආදායම - රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු | | | | | 90,000 |
| භාණ්ඩාගාර බිල්පත්වලින් ලද පොලී ආදායම | | | | | 243,000 |
| ප්‍රචාරණය | | | | | |
| - ශ්‍රමිකයන් බඳවා ගැනීමට | ඉඩ දේ | ආදායම ලබාගැනීමේ දී නිෂ්පාදනය තුළ අඩංගු වී ඇත. | | | |
| - විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් | 25% ඉඩ නොදේ | | | 112,500 | |
| නෛතික වියදම් | | | | 128,000 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | ඉඩ නොදේ | | | 136,000 | |
| විදේශීය ගමන් වියදම් | පෙර වසරේදී ව්‍යාපාරික ලාභයක් නොමැති නිසා සම්පූර්ණයෙන් ම ඉඩ නොදේ | | | 184,000 | |
| සංග්‍රහ වියදම් | ඉඩ නොදේ | | | 38,000 | |
| සමාගම පිහිටුවීමේ වියදම් | ඉඩ දේ | | | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| පරිත්‍යාග | ඉඩ නොදේ | ආදායම ගණනය කිරීමේදී නිෂ්පාදනය තුළ අඩංගු වී නැත | | 100,000 | |
| | | | | 13,922,350 | 1,044,800 |
| | | | | (1,044,800) | |
| **ගළපන ලද වෙළෙඳ ලාභය** | | | | **12,877,550** | |
| **<u>ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම</u>** | | | | | |
| වෙළෙඳ / ව්‍යාපාරවලින් ලද ආදායම | | | | 12,877,550 | |
| ලාභාංශ ආදායම - මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවේ | | | | - | |
| පොලී ආදායම | | | | 270,000 | |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | | | | **13,147,550** | |
| අඩු කිරීම් - අංක 32 ට අනුව | | | | | |
| බැංකු ණය පොලිය | | | | 68,200 | |
| එකතු කළ ආදායම | | | | **13,079,350** | |
| අඩු කිරීම් - යෝග්‍ය වියදම් සඳහා දීමනාව | | | | | |
| 'අපි වෙනුවෙන් අපි' අරමුදලට කළ පරිත්‍යාග | - රජයට කළ පරිත්‍යාග | | | 100,000 | |
| බදු අය කළ හැකි ආදායම | | | | **12,979,350** | |
| ව්‍යාපාරයේ ලාභය මත ආදායම් බද්ද | | 12,979,350 | 28% | 3,634,218 | |
| දළ ආදායම් බදු වගකීම | | | | **3,634,218** | |
| අඩු කිරීම් - | | | | | |
| ජාතික බදු බැර | | | | (27,000) | |
| ස්ව තක්සේරු පදනම යටතේ ගෙවීම් | | | | (1,500,000) | |
| **ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද** | | | | **2,107,218** | |

## 9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**2014/2015 තක්සේරු වර්ෂය සඳහා**

**රත්නායකගේ ආදායම් බදු ගණනය කිරීම**

| | | | |
|---|---|---|---|
| <u>සේවයෙන් ලද ආදායම</u> | | | |
| වැටුප 80,000 × 12 | | 960,000 | |
| ප්‍රසාද දීමනා | | 80,000 | |
| සංග්‍රහ දීමනා | | 180,000 | |
| ඔප්පුවේ / වාහනයේ වටිනාකම | 60,000 | | |
| (එක් වාහනයක අවම වටිනාකම හෝ රු. 50,000 ඉවත් කෙරේ - මසකට) | | | |
| | | | 1,220,000 |
| සේවක ආදායමෙන් ලද අතිරේක ප්‍රතිලාභ | | | (100,000) |
| | | | 1,120,000 |

| | | | |
|---|---|---|---|
| <u>දේපලවලින් ලද ආදායම</u> | | | |
| | | | |
| <u>ජීවත් වන නිවස</u> | එක් නිවසක් ශුද්ධ වාර්ෂික වටිනාකමෙන් නිදහස් වේ. | | |
| | | | |
| ශුද්ධ වාර්ෂික වටිනාකම | 120,000 | | |
| | | | |
| <u>කුලී ආදායම</u> | | | |
| දළ කුලිය | 600,000 | | |
| -ගෙවූ කුලිය | (27,000) | | |
| | 573,000 | | |
| -25% දීමනාව | (143,250) | | |
| ශුද්ධ කුලිය | 429,750 | | |
| <u>සැසඳුම</u> | | | |
| වාර්ෂික වටිනාකම | 135,000 | | |
| -25% දීමනාව | (33,750) | | |
| | 101,250 | | |
| ශුද්ධ කුලිය > ශුද්ධ වාර්ෂික වටිනාකම | | | |
| කුලී ආදායම | | | 429,750 |
| | | | |
| විකිණූ ඉඩම - ප්‍රාග්ධනිත ලැබීම්, ආදායම් ප්‍රභවයක් ලෙස නොසැලකේ. | | | |
| | | | |
| <u>පොලී ආදායම</u> | | | |
| ස්ථාවර තැන්පතු (රඳවා ගැනීමේ බදු අඩු කළ පසු) | | | 90,000 |
| | | | |
| ලාභාංශ ආදායම | | | |
| වෙනත් සමාගම්වලින් ලැබුණු ලාභාංශවලින් ගෙවන ලද | | 40,000 | |
| ලාභ සහ ආදායම්වලින් ගෙවන ලද | | 20,000 | 60,000 |
| | | | |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | | | 1,699,750 |
| අඩු කිරීම් - එකතු වූ ආදායමේ කොටසක් නොවූ ආදායම් | | | |
| ලාභාංශ ආදායම | | 60,000 | |
| පොලී ආදායම | | 90,000 | (150,000) |
| | | | |
| අඩු කිරීම - අඩු කිරීම් 32 කාණ්ඩයට යටත්ව | | | |
| පොලී ගෙවීම් - නිවාස ණය මත | | | (64,000) |
| (ආදායම මත සීමා වේ) | | | |
| එකතු වූ ආදායම | | | 1,485,750 |
| අඩු කිරීම් - යෝග්‍ය ගෙවීම් සඳහා දීමනාව | | | |

| | | | |
|---|---|---|---|
| අනුමත පුණ්‍ය ආයතන සඳහා පරිත්‍යාග | | (25,000) | |
| රක්ෂණ වාරික | | (53,400) | |
| | | (78,400) | |
| 1/3 අවමයකට හෝ රු. 75,000/- සීමා වේ. | | | (75,000) |
| නිවාස ණය සඳහා ප්‍රාග්ධන නැවත ගෙවීම් | ඉඩ නොදේ | | |
| බදු රහිත දීමනා | | | (500,000) |
| | | | |
| **බදු ගණනය කළ හැකි ආදායම** | | | **910,750** |
| | | | |
| <u>බදු වගකීම</u> | | | |
| පළමු රු. 500,000 @ 4% | | | 20,000 |
| ඉතිරි රු. 410,750@ 8% | | | 32,860 |
| | | | 52,860 |
| අඩු කිරීම් - බදු බැර | | | |
| උපයන විට ගෙවීම් බද්ද (PAYE) | | | (29,596) |
| **ගෙවිය යුතු ඉතිරි බද්ද** | | | **23,264** |

***C* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2014 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*